# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2072/20 - 2018 මැයි මස 22 වැනි අඟහරුවාදා - 2018.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මාතර - මිරිස්ස ජල සම්පාදන ක්‍රමයේ වැඩිදියුණු කිරීම් සඳහා මාළිගාතැන්න පැරණි ජල ටැංකිය වෙනුවට නව ජල ටැංකියක් ඉදිකිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1331.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාතර - කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 428 A, රුවන්ඇල්ල ග්‍රාම නිලධාරි වසමේ, රුවන්ඇල්ල ගමේ පිහිටි ගාල්ල කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද මාර 862 දරන මූලික පිඹුරේ කැබලි අංක 19 ලෙස දක්වෙන ඉඩමින් පර්චස් 02 ක් පමණ වන පහත සඳහන් වන මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | මාර 862 දරන මූලික පිඹුරේ කැබලි අංක 13 ඉඩම ; |
| *නැගෙනහිරට* | ඃ | ගම්මානයට යන පාර ; |
| *දකුණට* | ඃ | ගම්මානයට යන පාර ; |
| *බටහිරට* | ඃ | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* ඃ ඉලන්දාරිගේ අන්ද්‍රයස් මහතා,
නො ඃ 16, මාළිගාතැන්න,
මාතර

06 - 361

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මලාපවහන ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන පොම්පාගාර අංක : 08 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1376.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 479 A පහලවෙල ග්‍රාම නිලධාරී වසමේ සිංහපුර ගමේ පිහිටි ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 27 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | |
|---|---|
| *උතුරට* | : අංක : 817/B, දරන ගොඩනැගිල්ල ; |
| *නැගෙනහිරට* | : රොහිනා මාවත ; |
| *දකුණට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* : සොයාගත නොහැක.

06 - 362